# ආත්ම අනාත්ම

උච්ඡෙදවාදය මෙන් ම ශාස්වතවාදය ද පැවැත්ම පිළිබඳ ව වෙයි. අප කලින් සඳහන් කර ඇති පරිදි ශාස්වතවාදයෙහි දිගට ම පැවැත්මක් ගැන කියැවෙන අතර, උච්ඡෙදවාදයෙහි ටික කලකට පවතින්නක් ගැන කියැවෙයි. මරණින් කෙළවර වන්නේ ය යන්නෙහි තේරුම යමක් පැවතී කෙළවර වී ය යන්න ය. එවිට ප්‍රශ්නය වනුයේ එසේ තාවකාලික ව හෝ පවතින්නේ කුමක් ද යන්න ය. එසේත් නැතිනම් පවතින්නේ කවුරුන් ද යන්න ය.

බුදුන් වහන්සේ දෙසූ මධ්‍යම ප්‍රතිපදාවෙන් මේ අන්ත දෙක ම ප්‍රතික්ෂෙප විය. ඒ අන්ත දෙක ම ප්‍රතික්ෂෙප කළ හැක්කේ කිසිවක් හෝ කවුරුන් හෝ සදාකාලික ව වත් තාවකාලික ව වත් නො පවතින්නේ යැයි ගැනීමෙන් ය. බුදුන් වහන්සේ අනාත්මවාදයක් දෙසූවේ මේ අන්ත දෙක ම ප්‍රතික්ෂෙප කිරම සඳහා ය. තාවකාලික ව හෝ සදාකාලික ව හෝ පවතින ආත්මයක් නැත. එක් මොහොතකට වත් එක් ක්ෂණයකට වත් පවතින ආත්මයක් හෝ පුද්ගලයකු හෝ ධර්මයක් හෝ වෙනත් යමක් හෝ නැත.

බුදුන් වහන්සේ විසින් ප්‍රතික්ෂ්ප කරන ලද්දේ පුද්ගල ආත්මය පමණක් නො වෙයි. උන්වහන්සේ ධර්මාත්මය ද ප්‍රතික්ෂ්ප කළ හ. නැත්තේ මිනිසා හෝ සත්ත්වයා පමණක් නො වෙයි පුටුව, මේසය වැනි වස්තු ද නැත. පුටුවක් සදාකාලික ව නො පවතින බව කවුරුත් දනිති. බුදුන් වහන්සේට අනුව පුටුව තාවකාලික ව වුව ද නො පවතියි. වෛදික බමුණන්ට අනුව සදාකාලික ව පවතින බ්‍රහ්මන් සමග එකතු වන ආත්මයක් වෙයි. අද්වෛත වේදාන්තයෙහි මේ සංකල්පය මෙයට වඩා වර්ධනය වූ ආකාරයකින් ඉදිරිපත් වුව ද අවසානයේ දී එයින් ද කියැවෙන්නේ සදාකාලික බ්‍රහ්මන් ඇති බව ය. නැත හොත් පවතින බව ය.

අනාත්මවාදය ද වැරදි යැයි ඇතැම්හු කියති. ඔවුනට අනුව ආත්මයක් ඇතැ යි කීම මෙන් ම නැතැ යි කීම ද වැරදි ය. ආත්මයක් නැතැ යි කිව හැක්කේ ඇතැ යි යනුවෙන් ගැනීමෙන් පමණක් යැ යි ඔවුහු කියති. පුටුව නැතැ යි කිව හැක්කේ පුටුව ඇතැ යි යනුවෙන් පළමුව ගැනීමෙන් යැයි ඔවුහු පෙන්වා දෙති. එබැවින් අනාත්මවාදය වැරදි ය යන්න ඔවුන් ගේ පිළිගැනීම වෙයි. ඔවුනට අනුව අනාත්මවාදයක් පිළිගන්නා තැනැත්තා ආත්මවාදය ද පිළිගනියි. ප්‍රශ්නය වනුයේ ආත්මවාදය නො පිළිගෙන අනාත්මවාදය පිළිගත හැකි ද යන්න ය.

අනාත්මවාදය යන්න වැරදි යැයි කියන්නෝ ආත්මවාදය මෙන්ම අනාත්මවාදය ද ප්‍රතික්ෂ්ප කළ යුතු යැයි පවසති. මෙහි දී අප සැලකිලිමත් විය යුතු කරුණ නම් අනාත්මවාදය යන්න සම්‍යක්දෘෂ්ටියක් වීම ය. සම්‍යක්දෘෂ්ටියක් වුව ද දෘෂ්ටියක් වන බැවින් ඒ ප්‍රතික්ෂ්ප කළ යුතු යැයි ඇතැමකු සිතන්නට ඉඩ ඇත. එහෙත් ප්‍රශ්නය වනුයේ අපට කිසි ම දෘෂ්ටියක් නැති ව ජීවත්වීමට නොහැකි වීම ය. නිවන් දක්නා තෙක් ම මෙන්ම නිවන් දැකීමට ද අපට යම් දෘෂ්ටියක් අවශ්‍ය වෙයි. යම් දෘෂ්ටිවාදයක් නිවන් අවබෝධයට රුකුලක් වෙයි නම් ඒ සම්‍යක්දෘෂ්ටියක් වෙයි. ආර්ය අෂ්ටාංගික මර්ගය ද සම්‍යක් දෘෂ්ටියක් වෙයි.

අපි අනාත්මවාදය යන්න අමතක කර අනාත්මය යන්න ගනිමු. ආනාත්මය යැයි කිවහැක්කේ ආත්මය නැතැ යි යන තේරුමෙන් බැවින් එලෙස කීම ද වැරදි යැයි කීමට ඇතැමුනට හැකි ය. එයට හේතුව කලින් සඳහන් ආකාරයට ආත්මයක් නැතැ යි ගත හැක්කේ පළමුව ආත්මයක් ඇතැ යි ගැනීමෙන් බැවින් ය. එහෙත් මෙහි දී සඳහන් කළ යුතු වැදගත් ම කාරණය නම් අනාත්ම යන්න සංකල්පයක් නො වීම ය.

අනාත්ම යන්න ආත්මය නැතැ යි යන අරුතින් ගත් කල ඒ සංකල්පයක් වෙයි. අප අනිත්‍ය, දුක්ඛ ආනාත්ම අවබෝධ කර ගත යුතු යැයි කියන විට ඉන් අදහස් වන්නේ ආත්මයක් නැතැ යි අවබෝධ කර ගැනීම නො වෙයි. එලෙස අවබෝධ කර ගැනීම අනාත්මය සංකල්පයක් ලෙස ගැනීමක් වෙයි. අනාත්මය සංකල්පයක් ලෙස අවබෝධ කර ගැනීම අමාරු කාර්යයක් නො වෙයි. ආත්මයක් ඇත්නම් නැතැ යි යනුවෙන් ද අපට තේරුම් ගත හැකි වෙයි. ආත්මයක් නැතැ යි එලෙස තේරුම්ගත් පමණින් අපට නිවන් අවබෝධ නො වෙයි.

© Prof. Nalin De Silva

මෙයින් පැහැදිලි විය යුත්තේ අනාත්මය සංකල්පයක් නො වන බව ය. සංකල්පයක් ලෙස ආත්මයක් නැතැ යි යන තේරුමෙන් අනාත්මය අවබෝධ කළ ද, අපට නිවන් අවබෝධ නො වෙයි. එබැවින් පොදු ව්‍යවහාරයේ දී අනාත්ම යනු ආත්ම යන්නෙහි විරුද්ධාර්ථය වුව ද නිවන සම්බන්ධයෙන් ගත් විට අනාත්ම එලෙස ගැනීම වැරදි ය. පොදු ව්‍යවහාරයේ දී අනාත්ම යන්න සංකල්පයක් වුව ද නිවන සම්බන්ධයෙන් ගත් කල අනාත්ම සංකල්පයක් නො වෙයි. අපට නිවන මෙන් ම අනාත්ම අවබෝධ කරගැනීමට මෙතරම් අමාරු කාර්යයක් වී ඇත්තේ ද ඒ සංකල්ප නො වීම හේතුවෙන් ය.

එබැවින් අනාත්ම යන්න යොදා ගැනීමේ හෝ අනාත්මවාදය ලෙස ගැනීමේ හෝ වරදක් ඇතැ යි කිව හැකි නො වෙයි. එක් පැත්තකින් නිවනට සම්බන්ධ ව අනාත්ම සංකල්පයක් නො වෙයි. අනෙක් පැත්තෙන් නිවන් අවබෝධය සඳහා සම්‍යක් දෘෂ්ටි අවශ්‍ය බැවින් අනාත්මවාදයක් ලෙස ගැනීමෙහි ද වරදක් නැත. වරද ඇත්තේ බොරු පණ්ඩිතමානී වීමට තැත් කිරමෙහි ය. සමහරුන් කියන පරිදි ආත්මයක් ද නැත, අනාත්මයක් ද නැත, ආදී ප්‍රකාශවල මෙලොව වශයෙන් හෝ පරලොව වශයෙන් හෝ ඵලයක් නොමැත.

ආත්මයක් ද නැත, අනාත්මයක් ද නැත යනුවෙන් කී විට ඉන් යමකු තේරුම් ගන්නේ කුමක් ද? ආත්මය මෙන් ම අනාත්ම ය ද සංකල්ප බැවින් හා සංකල්ප යනු අපේ නිර්මාණ බැවින් ආත්මයක් මෙන් ම අනාත්මයක් ද නැතැ යි කීමට අපට හැකි වුවත් ඇතැම් උගතුන් ආත්මයක් ද නැත, අනාත්මයක් ද නැත යනුවෙන් ප්‍රකාශ කරන්නේ එවැනි අරුතකින් නො වන බව පැහැදිලි ය. ඔවුනට එලෙස කියන්නේ අනුනට තබා තමන්ට වත් නො තේරෙන අනාත්මයක් පිළිබඳ ව ය. අප මේ සියල්ලෙන් පරෙස්සම් විය යුතු ය.

නිවන, අනිත්‍ය, දුක්ඛ, ආනාත්ම සංකල්ප ලෙස ගැනීමෙන් බොහෝ දෙනා මුළා වෙති. එලෙස සංකල්ප ලෙස ගැනීම හේතුවෙන් ඔවුහු ආත්මයක් ද නැත, අනාත්මයක් ද නැත ආදී නිගමනවලට එළඹෙති. සංකල්ප ලෙස ගත් කල සියල්ල අපේ නිර්මාණ වෙයි. එහෙත් අනාත්ම යනු සංකල්පයක් ලෙස ගැනීම ද වැරදි ය. ආනාත්ම යන්න ආත්ම හා එක ම මට්ටමක ලා සැලකීම වැරදි ය.

අනෙක් අතට බුදුන් වහන්සේ ප්‍රතික්ෂේප කෙළේ ආත්මය ය. ආත්මයක් නැතැ යි යන්නේ අනාත්මයක් ඇතැ යි නො කියැවෙයි. අපට පැහැදිලි ව ම ආත්මයක් නැතැ යි කිව හැකි ය. එහෙත් අනාත්මයක් නැතැ යි යනුවෙන් ඒ ආකාරයෙන් පැහැදිලි ලෙස කිව හැකි නො වෙයි. පුටුවක් පෙන්නා එතැන පුටුවක් නැතැ යි අපට කිව හැකි ය. එහෙත් එලෙස කියන්නේ සාමාන්‍ය අර්ථයකින් නො වන බව අපි දනිමු. සාමාන්‍ය අර්ථයෙන් නම් එතැන පුටුවක් වෙයි. එහෙත් එතැන පුටුවක් නැතැ යි අප කියන්නේ ගැඹුරු දාර්ශනික අර්ථයකින් ය. පුටුවක් නැතැ යි එලෙස කීව ද එතැන නොපුටුවක් ඇතැ යි අපි නො කියමු. අප අනාත්ම සම්බන්ධයෙන් ද තේරුම් ගත යුතු ව ඇත්තේ ඒ කරුණ ය.

පුටුව නැතැ යි කීම හා නොපුටුවක් ඇතැයි කීම යනු එකක් ලෙස පෙනී ගිය ද ඒ එසේ නො වෙයි. වචනවල විරුද්ධාර්ථවලට සැම විට ම එක ම මට්ටමක වැදගත්කමක්, වටිනාකමක් නැත. අපට උස, මිටි යන වචන ගත් කල එකක් නැති ව අනෙක අවබෝධ කරගැනීමට නොහැකි ය. උස පොල් ගසක් උස යැයි අප දන්නේ මිටි පොල් පැළ ද ඇති බැවින් ය. එලෙස ගත් කල උස හා මිටි යන සංකල්ප එකක් අනෙකෙන් තොර ව නොපවතිනවාක් මෙන් ම එකක් අනෙකෙන් තොර ව අවබෝධ කරගැනීමට ද නොහැකි ය. මිටි යන්න නොමැති ව උස යන්නට තේරුමක් නො ලැබෙයි.

මෙහි දී අප වටහාගත යුතු ප්‍රධාන ම කරුණ නම් උස පොල් ගස් මෙන්ම මිටි පොල් පැළ ද ඇති බව ය. එනම් උස මෙන්ම මිටි යන්න ද පවතින ගුණ බව ය. මෙහි පවතින යන්න යොදා ගැනෙන්නේ ව්‍යවහාරික අර්ථයෙන් බව අමතක නො කළ යුතු ය. එලෙස ගත් කල උස හා මිටි යන සංකල්පයට ඇත්තේ එක ම මට්ටමකි. ඒ සංකල්ප දෙක ම පවතිනවා පමණක් නො ව එකක් නොමැති ව අනෙකට පැවැත්මක් ද නැත. එහෙත් සැම විරුද්ධාර්ථ දක්වන යුගලයකට ම එවැනි සමාන වටිනාකමක් නැත.

© Prof. Nalin De Silva

අපට මෙහි දී පැහැදිලි උදාහරණ දෙකක් සඳහන් කළ හැකි ය. ඒ ආත්මය, අනාත්මය යන යුගලය හා සසර, නිවන යන යුගලය වෙයි. අනාත්ම යන්න ආත්ම යන්නෙහි විරුද්ධාර්ථය ලෙස ගත්ත ද, ආත්මයක් නැතැ යි කීම අනාත්මයක් ඇතැ යි කීමක් නො වෙයි. පුටුවක් නැතැ යි කීම සෑම අවස්ථාවක දී ම නොපුටුවක් ඇතැ යි කීම නො වෙයි. උස අවබෝධ කරගැනීමට අපට මිටි යන්න අවශ්‍ය වුව ද, පුටුවක් ඇති බව අවබෝධ කරගැනීමට අපට නොපුටුවක් ඇතැ යි අවබෝධ කර ගැනීම අවශ්‍ය නො වෙයි. නොපුටුවක් ඇතැ යි යනු කුමක් ද? ඒ පිළිබඳව අපට කිව හැක්කේ කුමක් ද?

පුටුවක් ඇතැ යි අවබෝධ කරගැනීමේ දී ඒ මේසයක් නො වන බව අපි තේරුම් ගනිමු. එනම් සාධාරණ වශයෙන් ගත් කල (ෂබ ටැබැර්ක- පුටුවක් යනු නොපුටුවක් නො වේ යැයි අපට කීමට හැකි ය. අවශ්‍ය නම් අපට මේසයක් පෙන්වා එතැන නොපුටුවක් ඇතැ යි කීමට හැකි ය. එහෙත් එහි දී අප කතා කරන්නේ යම් පැවැත්මක් ගැන ය. නොපුටුවක් ඇතැ යි යනුවෙන් කියන්නේ මේසයක් ඇති බව කීමට ය. මේ සියලු පැවැත්ම ගැන අප සඳහන් කරන්නේ ව්‍යවහාරාර්ථයෙන් බව සෑම විට ම සිහි තබාගත යුතු වෙයි.

මේසයක්, කළු ලෑල්ලක්, බංකුවක් හෝ වෙනත් යමක් පෙන්වා එතැන නොපුටුවක් ඇතැ යි කීමට හැකි වුව ද, කිසිවක් නැති තැනක් පෙන්වා එතැන නොපුටුවක් ඇතැ යි කිව හැකි ද? කිසිවක් නැති රික්තයක වුව ද, බටහිර භෞතික විද්‍යාවට අනුව නොයෙකුත් ක්වොන්ටම් අන්තර ක්‍රියා සිදු වෙයි. එවැනි අන්තර ක්‍රියා ගැන දන්නා අයකු නොපුටුවක් ඇතැ යි යන්නෙන් ඒ අන්තර ක්‍රියා ඇති බව සිතිය හැකි වුව ද, ඒ ගැන කිසිවක් නො දත් අයකු එවැනි තැනක නොපුටුවක් ඇතැ යි කී කල ඉන් තේරුම් ගන්නේ කුමක් ද?

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva